"මත්ද්‍රව්‍ය ජාවාරම්වලට ෂාරුක්, දීපිකා, රන්බීර්, ශ්‍රද්ධා ඉන්දියාවේදී හසුවන විට ලංකාවේ නළු නිළියන් ගැනත් පරීක්ෂණ" යන සිරස්තලයෙන් යුතුව ඉරිදා දිවයින පුවත්පතේ මුල්පිටුවේ පළවූ ප්‍රධාන පුවතකි. කෙසේ වෙතත් මෙහි අන්තර්ගතය තුළ අදාළ නම් සඳහන් ඉන්දීය රංගන ශිල්පීන් හා ශිල්පිනියන් සම්බන්ධයෙන් සඳහන්ව තිබෙන්නේ ඔවුන්ට මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් "චෝදනා එල්ලවී" ඇති බවයි.

මේ පිළිබඳව ඉන්දියාවේ මාධ්‍ය මගින් අනාවරණය කරන්නේ, දිවයින පුවතේ සඳහන් උක්ත නළු නිළියන් (රන්බීර් සහ ෂාරුක් හැර) ඉන්දීය මත්ද්‍රව්‍ය පාලන කාර්යාංශයට (NCB) ප්‍රශ්න කිරීම සඳහා කැඳවූ බවයි. එයින් ඔවුන් මත්ද්‍රව්‍ය චෝදනාවන් සම්බන්ධයෙන් වරදකරුවන් බවට තහවුරු වී ඇති බවක් නොකියවෙන බවද අවධාරණය කළ යුතු වේ. එසේම රන්බීර් කපූර් හා ෂාරුක් ඛාන් වෙතද නිල වශයෙන් මත්ද්‍රව්‍ය චෝදනා එල්ල වී ඇති බවක්, පිළිගත් ඉන්දීය මාධ්‍ය හෝ වෙනත් ජාත්‍යන්තර මාධ්‍ය තුළ අපට සොයාගැනීමට නොහැකි විණි.

එසේ නම්, තවමත් නිල වශයෙන් මත්ද්‍රව්‍ය චෝදනාවන්ට වරදකරුවන් වී නොමැති ඉන්දීය රංගන ශිල්පීන් හා ශිල්පිනියන් "මත්ද්‍රව්‍ය ජාවාරම් වලට හසු වී" ඇති බවට මුල් පිටු පුවත් පළ කිරීම ඔස්සේ සිදුවන්නේ, මාධ්‍ය තුළ ඔවුන් වරදකරුවන් ලෙසින් දැක්වීම නොවේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස් මොනවාද?

මූලාශ්‍ර:
https://www.thehindu.com/.../deepika.../article32679147.ece
https://www.theguardian.pe.ca/.../top-bollywood-actors.../

**#MediaEthicsSL #lka #SinhalaPress #SundayDivaina**
See Less